# පරිපාලන අභියාචන විනිශ්චය අධිකාරය

**AAT/ 126 /2023 (PSC)**

**එල්.එම්.මහේෂ් ද සිල්වා**
**අභියාචක**
**එදිරිව**
රාජ්‍ය සේවා කොමිෂන් සභාව,
**වගඋත්තරකරු**

**දිනය :-2026.06.10**

| | | |
|---|---|---|
| ඉදිරියේ දී :- | විනිසුරු කේ.ටී.චිත්‍රසිරි | (සභාපති) |
| | ජේ.ජේ.රත්නසිරි | (සාමාජික) |
| | එස්.නන්දසේකරන් | (සාමාජික) |

පෙනී සිටීම :- අභියාචක වෙනුවෙන් නීතිඥ පි.අබේවික්‍රම මහතා, වගඋත්තරකාර රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙනුවෙන් සහකාර ලේකම් ඩබ්.එච්.ඒ.එස්.නදීෂානි මිය.

**-<u>නියෝගය</u>-**

**ජේ.ජේ.රත්නසිරි මැතිතුමා (සාමාජික) පරි.අභි.විනි. අධිකාරය**

අභියාචක 2000.08.10 දින අනියම් නියාමක නිලධාරියෙකු ලෙස බන්ධනාගාර දෙපාර්තමේන්තුවේ සේවයට එක්වී ඇත. 2001.10.01 දින සිට ස්ථිර නියාමකවරයෙකු ලෙසද, 2007.02.10 දින සැරයන්වරයෙකු ලෙසද උසස්වීම් ලැබ, ජ්‍යෙෂ්ඨතාවය හා කුසලතාවයක මත II පෙළ ජේලර් තනතුරට උසස් කිරීම සඳහා සම්මුඛ පරීක්ෂණයට පෙනී සිටින ලදි. මෙම සම්මුඛ පරීක්ෂණයෙන් ලකුණු 48ක් ලබා අදාළ ලේඛනයේ 66 වන ස්ථානයේ පසුවී ඇත. එම සම්මුඛ පරීක්ෂණයේ ප්‍රතිඵල මත සහ සුදුසුකම් පිළිබඳව සළකා බලා අයදුම්කරුවන් කිහිප දෙනෙකු සඳහා පත්වීම් ලබා දීම අත්හිටුවා සහ ඉවත් කිරීම් සිදුකර ඇති අතර, අදාළ ලේඛනයේ ඊළඟ සිටි අයදුම්කරුවන් සඳහා පත්වීම් ලබා දී ඇත. ඒ අවස්ථාවේ තමාද අදාළ තනතුර ලබා දෙන ලෙස රාජ්‍ය සේවා කොමිෂන් සභාවට ඉල්ලීම් කර ඇති අතර, රාජ්‍ය සේවා කොමිෂන් සභාව එම ඉල්ලීම ප්‍රතික්ෂේප කිරීම මත

අභියාචක 2023.06.24 දින මෙම අධිකාරයට අභියාචනයක් ඉදිරිපත් කර ඇත. අදාළ අභියාචනයෙන් අභියාචක ඉල්ලා සිටින්නේ,

**9:2.** රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ P3 තීරණය ඉවත් කරන ලෙසත්,

**9:3** II පෙළ ජේලර් තනතුරට 2013.06.13 වන දින සිට ක්‍රියාත්මක වන පරිදි උසස්වීම් ලබා දෙන ලෙසත්,

**9:4** ගරු විනිශ්චය අධිකාරයට උචිතයැයි හැඟී යන වෙනත් සහ වැඩිමනත් සහන ලබා දෙන ලෙසත් ය.

අභියාචක තමාගේ ස්ථාවරය තහවුරු කිරීම සඳහා 2026.01.20 දිනැතිව, ඇමුණුම් රැසක් සමඟ නිරීක්ෂණ ඉදිරිපත් කර ඇත. ඊට අමතරව විවෘත අධිකරණයේ දී වාචික පැහැදිලි කිරීම් ද සිදුකරන ලදි.

රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින්ද තම නිරීක්ෂණ 2023.08.29 දින, 2025.02.07 දින, 2025.12.30 දින සහ 2026.03.27 දින දරණ ලිපි සහ ඇමුණුම් මගින් ඉදිරිපත් කර ඇත. ඊට අමතරව විවෘත අධිකරණයේ දී තවදුරටත් පැහැදිලි කිරීම් ද සිදුකරන ලදි. 2023.08.29 දින නිරීක්ෂණ අනුව,

**2:1** The appellant Mr.L.M.Mahesh Silva has faced an interview held on 15.06.2013 and 16.06.2013, for promoting to the post of Jailor (Gr.II) on the basis of seniority and merit.

2:2 He had got 48 marks and became 66th place at the interview.

2:3 This interview was held for promoting 58 officers to the post of Jailor (Gr.II)

2:4 Accordingly, he has submitted his first appeal to the PSC on 19.05.2015, for not promoting him to this post. (**annexure 01**)

2:5 The public Service Commission has considered the matters mentioned in the said appeal, has conveyed its decision on 09.03.2018. (**annexure 02**)

2:6 However, according to the above decision, he has not got the post which was sought by his appeal.

2:7 After that, this appellant has submitted a re-appeal in this regard and requested to give him the relevant promotion. (**annexure 03**)

2:8 Accordingly, the PSC has re-considered all the concerned facts and has given an the order confirming the earlier decision in this regard.

2:9 Subsequently, the Commissioner General of Prisons submitted another letter in this regard on 25.10.2019, requesting the approval of the PSC to appoint 59 officers to the post of Jailer including this appellant. (**annexure 04**)

2:10 After considering the above request, the PSC has decided to reject the request on the ground that there is no possibility of promotion beyond the 58 vacancies which were considered at that time.

2:11 Thereafter, the appellant has filed another re-appeal and requested that 59 vacancies in the relevant post had been completed by 19.03.2018, when the PSC conveyed its first decision in this regard, and accordingly requested that he also be given the relevant promotion. (**annexure 05**)

2:12 Accordingly, a report was called again from the Secretary Ministry of Justice, prison Affairs and Constitutional Reforms in this regard and according to that report the following points are observed. (annexure 06)

a. Considering the results of the interview held in relation to this, it was first checked whether there are any pending disciplinary cases to be resolved regarding 59 officers based on the fact that there were two officers who obtained the same marks at the end of the merit list. (58 and 59 of the merit list has got equal marks)
b. It has been revealed that there are pending disciplinary inquiries to be resolved regarding 04 officers including one of the two officers who got equal marks at the end of the merit list.
c. According to that, apart from the two officers who were at the end of the merit list and the other three officers who had pending disciplinary inquiries, 54 officers were first promoted to the post of Jailor (Gr.II)
d. After that, the applicant who was in the 12$^{th}$ place in the merit list has not accepted the relevant post and the

applicant who was in the 43rd place in the merit list has been cleared from the disciplinary inquiry held against him.

e. Accordingly, two other officers have been promoted to the relevant post, including the officer who did not have pending disciplinary cases from the two officers who obtained equal marks at the end of the merit list.
f. The applicants at the ranks 40, 56 and 59 in the merit list were removed based on they were convicted in the disciplinary cases which were conducted against them and instead the officers at ranks 60, 61, and 62 in the merit list were subsequently promoted to the respective posts.
g. After that, one of the above three officers (who was at the rank 40 of the merit list) appealed to the PSC, and the PSC has decided to remove his punishment.
h. Accordingly, he has also been promoted to the relevant post due to this the number of filled vacancies has increased up to 59.
i. After that, according to an order given by the PSC, three officers have been demoted and accordingly the number of vacancies completed here has became 56.
j. Accordingly, there are still 02 vacancies that could have been filled at that time in the relevant post
k. There is a possibility of appointing the applicant who is at the 63rd rank in the merit list for one of those vacancies without any problem.
l. But next in the merit list there are three applicants who have got equal marks and one of them has pending disciplinary matter to resolve.
m. Accordingly, if both of the remaining officers are promoted to the respective post, the number of filled vacancies will be become 59.
n. This appellant is also there among those last two applicants.

මේ අනුව විසඳාගත යුතු ප්‍රශ්නය වන්නේ, සත්‍ය ලෙසට පුරප්පාඩු වූ තනතුරු ගණන 58ද නැතහොත් 59ද යන්නයි. රාජ්‍ය සේවා කොමිෂන් සභාව තනතුරු ගණන 58ක් ලෙස සඳහන් කර සිටී. අභියාචක එය 59ක් ලෙස විය යුතු බවු දන්වා සිටී. මේ පිළිබඳව දීර්ඝව සාකච්ඡා කළ මෙම අධිකාරය, පහත සඳහන් කරුණු කෙරේ අවධානය යොමු කරන ලදි.

01. අදාළ තනතුර සඳහා අයදුම්පත් කැඳවීමේ දැන්වීම අනුව පුරප්පාඩු කීයක් සඳහන් කර තිබුණාද යන්න. ඉදිරිපත් කර ඇති ලිපිය අනුව නිශ්චිත ලෙස පුරප්පාඩු ප්‍රමාණයක් සඳහන් කර නැත.

02. බන්ධනාගාර කොමසාරිස් ජනරාල් විසින් පුරප්පාඩු පිරවීම සඳහා ඉල්ලීම් කර ඇතිද යන්න. ඒ පිළිබඳව පැහැදිලි තොරතුරු නැත.

03. අදාළ අනුමැතිය රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් ලබාදීමේ දී, පුරප්පාඩු කීයක් පිරවිය යුතුද යන්න සඳහන් කර නැත.

04. පුරප්පාඩු ඇතිවූ ආකාරය පිළිබඳව සහ පුරප්පාඩු කීයක් නිශ්චිත ලෙස තිබේද යන්න ගණනය කළ අයුරු විස්තර සපයා නැත.

05. කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව මඟින් අදාළ දිනට පුරප්පාඩු පිළිබඳව පැහැදිලි සටහනක් නැති බව දන්වා සිටී.

06. බන්ධනාගාර කොමසාරිස් ජනරාල් විසින් මුල් අවස්ථාවේ දී තනතුරු 59 (55 පත්වී ඇත. 4 වෙන්කර තබා ඇත) යන සීමාවේ සිට කටයුතු කර ඇති බව පෙනේ.

07. බන්ධනාගාර කොමසාරිස් ජනරාල් විසින් 2019.10.20 දින ලිපිය මඟින් රාජ්‍ය සේවා කොමිෂන් සභාවට පුරප්පාඩු 59ක් පිරවීමට අවස්ථාව සළසා දෙන ලෙස ඉල්ලා ඇත.

08. අධිකරණ, බන්ධනාගාර කටයුතු හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා පිළිබඳ අමාත්‍යාංශයේ ලේකම් විසින් 2023.04.20 දිනැතිව රාජ්‍ය සේවා කොමිෂන් සභාව අමතා යවා ඇති ලිපියේ, 06 ඡේදය අනුව 2021.12.27 දිනට අදාළ සම්මුඛ පරීක්ෂණයෙන් සම්පූර්ණ කරන ලද තනතුරු ගණන 59ක් බව නිරීක්ෂණය වන බව දන්වා ඇත.

09. බන්ධනාගාර කොමසාරිස් ජනරාල් විසින් රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කරන ලද 2026.03.24 දින දරණ ලිපියේ 09 ජේදය යටතේ තනතුරු 59ක් බව පෙනේ.

"09. ***ඒ අනුව, ඉතිරි පුරප්පාඩු සඳහා ලකුණු ලේඛනයේ සම ලකුණු ලබා ඇති අංක 64 හා 66 යන ස්ථාන වල සිටින ජේ.ආරියපාල, හා එල්.එම්.මහේෂ් සිල්වා යන නිලධාරීන් දෙදෙනා සුදුසුකම් ලබා සිටී. එම නිලධාරීන් දෙදෙනා හට II පෙල ජේලර් තනතුරු ලබාදුනහොත්, නියමිත පුරප්පාඩු සංඛ්‍යාව 58 ඉක්මවා යයි. රාජ්‍ය සේවා කොමිෂන් සභා ලේකම්ගේ අංක PSC/AP/4/26/20 හා 2018.03.09 දිනැති ලිපියේ 03 ජේදයේ ii කරුණින් ලබාදෙන ලද නියෝග අනුව එම පුරප්පාඩු සීමාව ඉක්මවා තනතුරු ලබාදිය නොහැකි බැවින්, එම නිලධාරීන් දෙදෙනා II පෙළ ජේලර් තනතුරට උසස් කිරීම සිදුකර නොමැති බව කාරුණිකව දන්වා සිටිමි.***"

10. ඒ අනුව පැහැදිලි වන්නේ, 2018.03.09 දින රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් නිකුත්කල ලිපිය අනුව මෙම ගැටලුව මතුවී ඇති බවයි.

අදාළ සම්මුඛ පරීක්ෂණය 2013.06.15 හා 16 දින වල පවත්වා සියළු කටයුතු කර, 2018.03.09 දින පුරප්පාඩු 58ට වඩා නොපුරවන ලෙස රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ දැන්වීම අනුව, මෙම ගැටලුව පැන නැඟී ඇත. එම තීරණය සඳහා පිළිගත හැකි හේතූන් සඳහන් කර නොමැත.

ඉහත සියළු කරුණු කෙරේ අවධානය යොමු කිරීමේ දී තවදුරටත් පුරප්පාඩු 58ක් ලෙස සැලකූ විට එක් පුරප්පාඩුවක් සහ පුරප්පාඩු 59ක් ලෙස සැලකූ කළ පුරප්පාඩු 02ක් පිරවීමට ඉතිරිව ඇත. මෙම අධිකාරයට පැමිණ ඇත්තේ එක් අයෙක් පමණි. ඒ අනුව මෙම අභියාචකගේ ඉල්ලීමට ඉඩදීම යුක්ති සහගත බව පෙනේ.

ඒ අනුව රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් ලබා දී ඇති තීරණය වන P3 අවලංගු කිරීමට තීරණය කරමු. මේ අභියාචකද 2013.06.16 දින සිට අදාළ තනතුරට උසස් කිරීම සුදුසු බවට යෝජනා කරමු. එසේ වුවත්, අභියාචක අදාළ තනතුරේ මේ දක්වා කටයුතු කර නැති බැවින්, හිඟ වැටුප් ගෙවීමකින් තොරව එම තනතුරට උසස් කිරීමට වැඩිදුරටත් නියෝග කරමු.

අභියාචකගේ ඉල්ලීමට සංශෝධන සහිතව ඉඩදී ඇත. එම තීරණය අභියාචක, බන්ධනාගාර කොමසාරිස් ජනරාල් හා ලේකම්, රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත දන්වන්න.

කොන්දේසි සහිතව අභියාචනයට ඉඩදී ඇත.

*ජේ.ජේ.රත්නසිරි*
*(සාමාජික)*

මම එකඟ වෙමි

විනිසුරු කේ.ටී.චිත්‍රසිරි
(සභාපති)

මම එකඟ වෙමි

එස්.නන්දසේකරන්
(සාමාජික)

ලලිතා/-